# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# தேசிய வரவு செலவுத்திட்ட திணைக்களம்
# DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத்திறைசேரி, நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு, கொழும்பு 01, இலங்கை
General Treasury, Ministry of Finance and Mass Media, Colombo 01, Sri Lanka

Web Site: www.treasury.gov.lk e-mail: budget@nbd.treasury.gov.lk


| මගේ අංකය<br>எனது இல.<br>My No. | BD/CBP/4/1/2-2018 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | - | දිනය<br>திகதி.<br>Date | 2017.07.31 |
|---|---|---|---|---|---|

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**අයවැය කැඳවීම - 2018 සඳහා අතිරේකය (II)**
**2018 අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ**

මෙය "වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදේශ" පිළිබඳ 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2017 ට වැඩිමනත් වශයෙනි. මෙම අතිරේකයේ දී රජය විසින් පිළිගනු ලැබ ඇති නව ප්‍රතිපත්තිමය උපායමාර්ග තුන සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීම පිළිබඳව තවදුරටත් මාර්ගෝපදේශ ලබාදීමට අපේක්ෂා කෙරේ.

1. තිරසර සංවර්ධන අරමුණු
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය
3. ආබාධිත පුද්ගලයින් සවිබල ගැන්වීම

**(1) තිරසර සංවර්ධන අරමුණු**

1.1 දර්ශක 244 කින්, ඉලක්ක 169 කින් සහ අරමුණු 17 කින් සමන්විත වන 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට එකඟවීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත. තිරසර සංවර්ධන අරමුණු (SDG) වලින් අපේක්ෂා කෙරෙනුයේ දරිද්‍රතාවය, කුසගින්න සහ අසමානතාවය අවසන් කිරීම, පරිසරය සුරැකීම, සෞඛ්‍ය සහ අධ්‍යාපනය වෙත ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම, සාමය ගොඩනැගීම, සාධාරණත්වය සහ ශක්තිමත් ආයතන ස්ථාපිත කිරීම යනාදියයි. මෙම තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම අයවැයකරණය සමග සෘජුවම, එනම් හඳුනා ගත් ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා සම්පත් වෙන් කිරීම සිදුවිය යුතුය. එබැවින්, 2018 වර්ෂයේ සිට තිරසර සංවර්ධන අරමුණු (SDG), ජාතික සංවර්ධන උපායමාර්ග සමග එක්ව පෙළ ගැස්වීමට අපේක්ෂා කෙරේ. අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සැලසීමට සහ ඒවා අධීක්ෂණය කිරීම සඳහා තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක්ද පිහිටුවා ඇත.

1.2 එම නිසා, වර්තමාන සහ අනාගත සංවර්ධන කටයුතු තුළ තිරසර සංවර්ධන අරමුණු සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීම සහ වාර්ෂික අයවැය සමග පෙළගැස්වීම සඳහා වියදම් කිරීමේ ආයතනවලට මාර්ගෝපදේශ ලබා දේ. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ වන්නේ වියදම් කිරීමේ ආයතනයට විශේෂිතවම අදාළ වන තිරසර සංවර්ධන අරමුණුවල විශ්ව න්‍යාය පත්‍රය හඳුනා ගැනීම හා දේශීයකරණය කිරීම සහ එම තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සෘජුවම උපකාරී වන සංවර්ධන උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම වේ.

1.3 තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ 2030 න්‍යාය පත්‍රය අධීක්ෂණය කිරීම සඳහා තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය මගින් අදාළ අමාත්‍යාංශ වෙත පහසුකම් සපයනු ඇත. තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ජාතික සංවර්ධන රාමුව තුළට අනුගත කිරීම පිළිබඳව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහතික වනු ඇති අතර, සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් සැලසුම් කිරීමේදී ඒවා ඇතුළත් කිරීම පිළිබඳ වගකීම රේඛීය අමාත්‍යාංශ මගින් දරනු ලැබේ.

1.4 2030 වර්ෂය අවසානයේ දී තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගනු ලැබ තිබේද යන්න පිළිබඳව සහතික වීම පිණිස තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවද සහාය දක්වයි. ඒ ඒ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතනවලට අදාළ වන තිරසර සංවර්ධන අරමුණු හි දර්ශක දේශීයකරණය කිරීමේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු දර්ශකයන්හි තත්ත්වය : 2017 ( Status of Sustainable Development Goals Indicators in Sri Lanka:2017 ) ආශ්‍රිත කරගත හැක.

**(2) ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය**

2.1 තිරසර සංවර්ධන අරමුණු අංක 5 හි දැක්වෙනුයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සම්බන්ධයෙන් වේ. ශ්‍රී ලංකාවේ මුළු ජනගහණයෙන් අඩකටත් වඩා නියෝජනය කරනු ලබන්නේ කාන්තාවන් සහ ගැහැණු ළමුන් බැවින්, සම්පත් වෙන්කිරීමේදී හැකි සෑම අවස්ථාවකදීම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කළයුතුය. ඒ අනුව, අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අමාත්‍යාංශවලට සළකා බැලීම සඳහා, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මගින් සකස් කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක ඇමුණුම I හි දක්වා ඇති අතර, වර්ෂ 2018 දී ළඟා කර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන කාර්යසාධන දර්ශක සඳහන් කළයුතු වේ.

2.2 2016.06.07 දින ලබාදුන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, 2017-2019 දක්වා වන මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ආරම්භ කිරීමට නියමිතය. මෙම ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන අරමුණ වනුයේ " කාන්තාවන් සහ ළමුන්ට ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිතයක් " යන්නයි. මෙම සැලසුම මගින් බහු ආංශික ක්‍රියාත්මක කිරීම් ආවරණය වන බැවින්, අදාළ රේඛීය අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් විසින් සැලසුම් පිළිපැදීම සඳහා අවශ්‍ය පියවරයන් ගත යුතුය.

**(3) ආබාධිත පුද්ගලයින් සවිබල ගැන්වීම**

3.1 2018 අයවැයේ දී සලකා බැලිය යුතු තවත් වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ ආබාධිත පුද්ගලයින්ට වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීමයි. ජාතික ආබාධිත ප්‍රතිපත්තිය මත පදනම්ව සකස් කරනු ලැබ ඇති සහ සවිබල ගැන්වීම, සෞඛ්‍ය සහ පුනරුත්ථාපනය, අධ්‍යාපනය, රැකියා සහ සේවා නියුක්තිය, පරිසරය, දත්ත හා පර්යේෂණ සහ සමාජ ආයතනික ඒකාබද්ධතාවය සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබාදීම හා ශක්තිමත් කිරීම යන තේමාගත ක්ෂේත්‍ර 7 ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇති " ආබාධිතභාවය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම " ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය දැනටමත් නිර්දේශ කර ඇත. රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, ආබාධිත ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා වන ක්ෂේත්‍රයන් හා අදාළ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ ඔවුන් සමාජයේ සම ඵලදායී කාණ්ඩයක් ලෙස ඉදිරියට මෙහෙයවීම සියලුම වියදම් කිරීමේ ආයතන මගින් සිදුකිරීම අවශ්‍ය වේ.

(4) 2018 අයවැය, කාර්ය සාධනය මත පදනම් වූ අයවැයකරණය මත සකස් කෙරෙන බැවින්, මැනිය හැකි නිමැවුම් / ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා සම්පත් ඉල්ලා සිටීමේදී ඉහත කරුණු පිළිබඳව සැළකිලිමත් වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

(5) ඉහත කරුණු පිළිබඳව ඔබට යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ විෂය නිලධාරියා ඇමතීමට කාරුණික වන්න.

**අත්.කළේ / කේ.ඩී.එස්.රුවන්චන්ද්‍ර**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත්:

I. ජනාධිපති ලේකම්
II. අග්‍රාමාත්‍ය ලේකම්
III. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
IV. විගණකාධිපති

**ඇමුණුම 01**

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය ළඟාකර ගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා වන ප්‍රධාන කාර්යසාධන දර්ශක**

1. ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම
2. මූලාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩිවීම
3. ස්ත්‍රී පුරුෂ භාවය වෙන්කර දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව
4. ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන ඇති ඉහළ කාන්තා ප්‍රතිශතයේ වැඩිවීම සහ කාර්මික වෘත්තිය ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමු වී ඇති සංඛ්‍යාව
5. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය / සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායිකාවන් සංඛ්‍යාව
6. ආපසු පැමිණි හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව
7. ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන ඉහළ කාන්තාවන් සංඛ්‍යාව
8. ස්ත්‍රී පුරුෂ මිත්‍රශීලී රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවරයන් ගෙන ඇති ආයතන සංඛ්‍යාවේ වැඩිවීම
9. ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා පවතින ඵලදායී ලෙස ක්‍රියාත්මක වී ඇති ප්‍රතිපත්තීන් සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව
10. කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායී අයුරින් හැසිරවීම සඳහා ධාරිතාවය ඉහළ නැංවූ පොලිස් ස්ථාන වල ඇති කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව
11. ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වෙනස්කම් සහිත නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් සංශෝධනය කර ඇති පනවා ඇති සහ / හෝ ක්‍රියාත්මක කර ඇති සංඛ්‍යාව
12. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය විසඳීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය